

# ඔබේ දරුවා සහ VCE විභාගය

නලිනි දේවේන්ද්‍ර

## ගණන් ඉලක්කම් අතරින් VCE විභාගයට

උපකාරක පන්ති ඕනෑමද?
''පහේ ශිෂ්‍යත්ව විභාගයට ළමයා ඉන්ද-වන්න තුනේ පන්තියේ දී ඉඳන්ම ටියුෂන් යවන්න වෙලා...'' මේ අද ලංකාවේ දෙමව්පියන්ට මූණ දෙන්න වෙලා තියෙන තවත් ප්‍රශ්ණයක්. ශිෂ්‍යත්ව විභාගයට තමන්ගේ දරුවාව ඉදිරිපත් කරන්නේ ජනප්‍රිය පාසැලකට ළමයව හයේ පන්තියේදීවත් ඇතුලත් කර ගන්න. ඒත් ලංකාවේ පවතින සමාජ, ආර්ථික රටාව, කාර්ය බහුලකම නිසාම මේ වෙනුවෙන් කැපවෙන්න පුළුවන් කීයෙන් කී දෙනාටද? සමහර විට මව්රට අතහැරලා මේ වගෙ රටකට සංක්‍රමණය වෙන්න ඔය වගේ හේතුන් බලපාන්න ඇති.
''ඇවිත් බලපුවාම මෙහෙත් ටියුෂන් ....෧ '
සන්නස නලිනි දේවේන්ද්‍ර ආචාර්යවරිය දෙසට හැරුණා.

''ඔය අහන්නෙ, මොකද මෙහෙම ටියුෂන් දෙන්න වෙලා තියෙන්නේ කියලනෙ? නලිනි දිග කතිකාවතකට මුල පිරුවා.

මේ ප්‍රශ්නයට ලේසියෙන් උත්තරයක් දෙන්න අමාරුයි. දරුවන් අමතර පන්තිවලට සහභාගි වෙන්නෙ ඇයි කියන එකට විවිධ ආකාරයේ හේතු තියෙනවා. මුලින්ම මම වික්ටෝරියාවේ ගුරුවරියක් හැටියට සේවය ආරම්භ කළ කාලයේ, 1990 - 1991 වර්ෂ වල, අමතර පංති ගැන අහන්න ලැබුණේ හුඟාක් අඩුවෙන්. දරුවෙක් අමතර පන්තියකට ගියේ නැත්නම් පුද්ගලික ගුරුවරයෙක් නිවසට ගෙන්වා ගෙන අමතර උදව් ගැනීම කළේ යම් යම් විෂයයන් වල නොතේරෙන යම් යම් කොටස් හරියට ඉගෙන ගැනීමට. එහෙම නැත්නම්, අසනීපයක් හෝ වෙනත් හේතුවක් නිසා අතපසු වුණ පාසල් වැඩ ඉගෙන ගැනිම සඳහා විතරමයි. ඒත් පසුගිය වසර 17 - 18 තුළ මේ තත්ත්වය ක්‍රම ක්‍රමයෙන් වෙනස් වුණ හැටි මම පැහැදිලිවම දැක්කා.
1990 ට පෙර, 1980 දශකයේ, ද්විතීයික පාඨශාලාවල බොහෝමයක් හිටියේ යුරෝපීය සම්භවයක් ඇති දරුවන්. මේ දරුවන් සහ දෙමව්පියන් අධ්‍යාපනය දිහා බැලුවේ අප බලන ආකාරයට නොවෙයි. බොහෝ ඕස්ට්‍රේලියානු ජාතික දෙමව්පියන් උසස් අධ්‍යාපනය දෙස බලන්නේ ජීවිතයේ එක් අංගයක් හැටියට මිසක් ප්‍රධාන අංගයක් හැටියට නෙවෙයි. පාසලේ ගත කරන පැය 7 තුළ පාසල් වැඩත්, ගෙදර ගත කරන අනිත් කාලය තුල වෙනත් ක්‍රියාකාරිකම් (ක්‍රීඩා/සංගීතය හෝ වෙනයම් දේවල්) කිරීමත් තමයි ඒ අයගේ පිළිවෙල. පාසැලේදී දරුවා ප්‍රමාණවත් තරමට අධ්‍යාපනික කටයුතු කරන නිසා ගෙදර දී කරන්න යදපෑ අදරන දෙන්න එපා කියන ඕස්ට්‍රේලියානු ජාතික දෙමව්පියන් බොහෝ මයක් ඒ කාලයේ සිටියා.

එහෙත් 1990 දශකයේදී මේ තත්ත්වය වෙනස් වුණා. ආසියාතික සම්භවයක් ඇති දරුවන් (ශ්‍රී ලාංකික, ඉන්දියානු, චීන, වියට්නාම ජාතික ආදී) ද්විතීයික පාසැල්වල වැඩිවෙන විට මේ තත්ත්වය ක්‍රම ක්‍රමයෙන් වෙනස් වුණා.
ආසියාතික අපේ ජීවන රටාව, ජීවන දර්ශනය වෙනස්. අපේ චින්තනය අනුව පතපොතේ අධ්‍යාපනය සහ ඒ අධ්‍යාපනය නිම කිරීමෙන් ලබා ගන්නා සහතික තමයි අපේ ජීවිතේ දරුවෙක් ලබන විශාලතම ජයග්‍රහණය ලෙස දකින්නේ. අප, අපේ දරු-වන් කුඩා කාලයේ සිටම ඒ අය පසුපසින් ඉඳගෙන ඒ අයගේ පාසල් අධ්‍යාපනය ගැන ඉතා විශාල අවධානයක් යොමු කරනවා. දරුවාගේ පත පොතේ දැනීම දියුණු කිරීම සඳහා දරුවාට අවශ්‍ය වුණත් නැතත්, දරුවා කැමති වුණත් නැතත් දරු-වාව අමතර පංතිවලට සහභාගි කරවනවා.

මෙහි ප්‍රතිඵලය තමයි අද අප මේ දකින්නේ. මේක අප විසින්ම නිර්මාණය කරගත් තරඟයක්.

දරුවන් ගේ අධ්‍යාපන මට්ටම ඉහළ නැංවීම සඳහා උදව් කිරීම නරක හෝ වැරදි දෙයක් නොවෙයි. එහෙත් වැරැද්ද සිදුවන්නේ මෙය පමණ ඉක්මවා සිදුවන විටයි.
ඕස්ට්‍රේලියානු ජාතික එහෙම නැත්නම් යුරෝපීය සම්භවයක් ඇති දෙමව්පියන් සාමාන්‍යයෙන් තම දරුවන් උසස් අධ්‍යාපනය සඳහා තෝරා ගන්නා ක්ෂේත්‍ර පිළිබඳව බලපෑම් කරන්නේ නෑ. දරුවන් ද්විතීයික පාසැල් කාලයේදී පහසුවෙන් සහ අභිරුචියකින් යුතුව ඉගෙන ගන්නා විෂයයන් මොනවා හෝ ඇත්නම්, ඒ විෂයයන් උසස් අධ්‍යාපනය සඳහා තෝරා ගන්නයි මේ දෙමව්පියන් තම දරුවන් යොමු කරවන්නේ. 1990 දශකයට පෙර අමතර පන්ති ගැන අහන්න නොලැබුණේ මේ හේතුව නිසයි. එහෙත් අප, ආසියාතික දෙමව්පියන් සාමාන්‍යයෙන් දරුවන්ට අවශ්‍ය දේ තෝරා ගන්නටවත් දරුවන්ට කැමති විදිහට උසස් අධ්‍යාපනය කරන්නටවත් ඉඩ දෙන්නේ නෑ. දරුවා ප්‍රාථමික පාසැල් වයසේ සිටින කාලයේ සිටම දරුවා උසස් අධ්‍යාපනය සඳහා තෝරාගත යුතු ක්ෂේත්‍රය අප යම් ප්‍රමාණයකට තීරණය කරනවා. ඊළඟට ඒ ක්ෂේත්‍රය සඳහා අවශ්‍යය වන පාසැල් විෂයයන් ද්විතීයක පාසැලේදීම ඉගෙන ගැනීම පහසු වෙන්නට හැකිවන නොවරදින මාර්ගය කියා හිතාගෙන ඒ ඒ විෂයයන් සඳහා අමතර පන්තිවලට යවනවා. දරුවා කැමති වුණත් නැතත් අපි මේ දෙය දරුවාට කරනවා.

දරුවෙක් ප්‍රාථමික පාසැල් වයසේ සිටින කාලයේදීම දරුවාගේ යම් යම් දක්ෂතා හෝ දුර්වලකම් හඳුනා ගෙන ඒ දක්‍ෂතා වැඩිදියුණු කිරීමට හෝ දුර්වලකම් මග හැරීමට උදව් කිරීම ඉතාම හොඳයි. එහෙත් එය පමණ ඉක්මවා, කරන්නන් වාලේ කරන්නට යාමෙන් දරුවාට සිදුවන්නේ සෙතකට වඩා අවැඩක්. ආසියාතික සම්භවයක් ඇති දෙමව්පියන් තම දරු-වන් උපකාරක පංතිවලට ප්‍රාථමික වයසේ සිටම යවන සැටි බලාගෙන සිටින යුරෝපීය සම්භවයක් ඇති දෙමව්පියන් සමහර විට විමතියට පත්වෙනවා. ලාංකික, ඉන්දියානු, චීන, වියට්නාම් ජාතික දරුවන් පාසැලෙන් පසු හෝ සති අන්තයේදී විශේෂයෙන්ම ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගන්නට උපකාරක පන්තිවලටත්, ඊලඟට 4 වන වසර, 5 වන වසර වනවිට පුද්ගලික පාඨශාලා (Grammer Schools) සඳහා පැවැත්වෙන ශිෂ්‍යත්වවලට සූදානම් කරවීමේ පන්තිවලටත් යවනවා. "Kumon" පංති වැනි දේවල් අපේ දෙමව්පියන් අතර හරිම ජනප්‍රියයි. එහෙත් මේ දේවල් හැමදේම හැම දරුවෙක්ටම සුදුසු වෙන්නේ නෑ. දරුවා කුඩා කාලයේ සිටම දරුවාට හොඳට අවබෝධ කරගෙන දරුවාට අවශ්‍ය මොනවා ද කියා බොහෝම ප්‍රවේශමෙන් තීරණය කර ගැනීම තමයි වඩා සුදුසු වන්නේ.
ප්‍රාථමික පාසැල් වයසේදී, ගෙදරදීම දරු-වාගේ ඉංග්‍රීසි භාෂා දැනුම සහ ගණිත දැනුම වර්ධනය කරන්නට පුළුවනි දෙමව්පියන්ට. පාසැල් නිවාඩු කාලවල දරු-වන් සමග එකතු වී කාලසටහනකට අනුව වැඩ කිරීමෙන් දරුවන්ගේ දැනුමේ ලොකු දියුණුවක් ඇති කරවන්නට පුළුවනි.
ප්‍රාථමික වයසේදීම දරුවන් උපකාරක පංතිවලට යවා අවශ්‍ය ප්‍රමාණයට වඩා දරුවන් වෙහෙස කරවීමෙන් ඉතාම නරක ප්‍රතිඵල ඇති වෙන්නට පුළුවන්.
උදාහරණයක් හැටියට Kumon පංතිවලට යන සමහර දරුවන් ඒ අභ්‍යාස සම්පූර්ණ කරන්නේ ඉතාමත්ව අමාරුවෙන්. ප්‍රාථමික වයසේ Kumon පන්තිවලට සහභාගි වී ගිරවෙක් වගේ ලබා ගන්නා ගණිත දැනුම 7 වන 8 වන ශ්‍රේණිවලදී සම්පූර්ණයෙන්ම අමතක කර දමන දරුවන් බොහෝදෙනෙක් මා දැක තිබෙනවා.

දරුවන් 4 වන 5 වන ශ්‍රේණිවලට යනවිට අපේ දෙමව්පියන් දරුවන්ව පුද්ගලික විද්‍යාලවල ශිෂ්‍යත්ව සඳහා වන උපකාරක පන්ති වලට යවනවා. මේ උපකාරක පන්තිවලින් ඒ ශිෂ්‍යත්ව විභාග සඳහා විශාල රුකුලක් දරුවන්ට ලැබෙනවාද කියන එක නම් මා හරියට දන්නේ නෑ. මොකද මේ ශිෂ්‍යත්ව විභාග නිර්මාණය කර තිබෙන්නේ සහජයෙන්ම ඉතාමත් බුද්ධිමත් සහ තීක්‍ෂණ බව ඇති දරුවන් තෝරා ගැනීම සඳහායි. මේ ශිෂ්‍යත්ව විභාගවලදී බොහෝවිට මැනෙන්නේ දරුවන්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම සහ සහජ බුද්ධිය :ෂු*ග හැම දරුවෙක්ම එක වගේ නැහැ-නේ. තමන්ගේ දරුවා මොන වගේද කියන එක හරියට වටහා ගෙන ඒ දරුවාට සුදුසු දේ දරු-වාගේ සම්පූර්ණ කැමැත්තෙන් කරවන එක තමයි වඩා සුදුසු. තරගකාරී විදිහට කරන්නන් වාලේ මේ පන්තිවලට දරුවාව යවනවාට වඩා දරුවන් ද්විතීයික පාසැලකට යන්නට ආරම්භ කරන විටම අප කරන්නේ දරුවා විසින් ඩ්ඍ විභාගයට තෝරා ගත යුත්තේ මොන විෂයයන්ද කියා තීරණයකට පැමිණීමයි.
ඊළඟට අප කරන්නේ අප ගන්නා මේ තීරණ අනුව ඒ ඒ විෂයය ඉගෙන ගැනීම පහසුවෙන්නට කියා අමතර පන්තිවලට යැවීමයි. තමන්ගේ දරුවාගේ දක්‍ෂතා සහ දුර්වලතා හරියට අවබෝධ කර ගන්නේ නැතිව, දරු-වාගේත්, දරුවාට 7 සිට 10 ශ්‍රේණි දක්වා උගන්වන ගුරුවරුන්ගේත් අදහස් විමසන්නේ නැතිව යවන්නන් වාලේ අමතර පන්තිවලට දරු-වන් යැවීමෙන් කිසිම ප්‍රයෝජනයක් ඇති කියා මම නම් සිතන්නේ නෑ.

උපකාරක පන්ති පිළිබඳව ''සන්නස'' අසපු ප්‍රශ්ණය ගැන නලිනි සෑහෙන්න සංවේදියි. තර්කානුකූලව කරුණු ඉදිරිපත් කරමින් ඇය කළ අදහස් දැක්වීම මෙයින් නිමාවෙන්නෙ නෑ. ''සන්නස'' පාඨකයින් වෙනුවෙන් ලබන කලාපයේදී ඇය ඩ්ඍ විභාගය සම්බන්ධව උපකාරක පන්තිවල බලපෑම ගැන කතා කරන්නට අදහස් කරනවා. ඒ වෙනුවෙන් නලිනි වෙන කැපවීම අපට මිළ කරන්නට බෑ. ලබන කලාපයෙන් ඇයව මුණ ගැහෙන තුරු අප ඇයට සමුදුන්නේ ස්තූති පූර්වකවය.

සාකච්ඡා කළේ - සිසිර දිසානායක

## සුභාෂිතයෙන්

පුන් පිරිසිදු සිල් මුල් ගුන කඳින් යුති
දන් කම නැත කුරු මල් සා මඬුලු ඇති
පින් කප්තුර සග මොක් පල දෙන කැමති
මන් සුදනන් මෙත් සිලිලෙන් වැඩෙය් නිති

**අන්වය :** පුන් පිරිසිදු සිල් මුල් ගුණ කඳින් යුති දන් කම නැත අකුරු මල් සා මඬුලු ඇති කැමති සගමොක් පල දෙන පින් කප්තුර සුදනන් මන් මෙත් සිලිලෙන් නිති වැඩෙය්.

පුන් පිරිසිදු සිල් මුල් - සම්පූර්න වූ පිරිසිදු සිල් නැමති මුල් ඇති, ගුන කඳින් යුති - ගුන නැමති කඳින් යුක්ත වූ, දන් කම නැන - දානය ද සමාව ද , ඥානය ද නැමති අකුරු මල් සා මඬුලු ඇති - අංකුර (අතු රිකිලි) මල් සාකා මන්ඩල (අතුපතර) ඇති , කැමති - , සග මොක් පල දෙන - ස්වර්ග මොක්ස නැමති ගෙඩි ලබාදෙන, පින් කප්තුර - සුදනන් (ගේ) - මන්, සිතෙහි, මෙත් සිලිලෙන් - මෛත්‍රී නැමති ජලයෙන්, නිති වැඩෙය්.

සිල්වත් කම නැමති මුල් ඇති, ගුනවත් කම නැමති කඳ ඇති, දානය සමාව නැන නුවන නැමති (අතු) රිකිලි මල්, අතු පතර ඇති, ලබා ගැනීමට කැමති ස්වර්ග මෝක්ස නැමති ගෙඩි ලබා දෙන, පින් නැමති කප්තුර සුදනන්ගෙ සිතෙහි මෛත්‍රී නැමති ජලය නිසා හොඳින් වැඩේ.

''ක්ෂමා'' යන වචනය සිංහලට බිඳෙන්නෙ ''සමා/කමා යනුවෙනි. එය මෙහි ''කම'' වී ඇත්තේ විරිත රැකීම සඳහා ය. සමාව/කමාව යන අරුත දීම සඳහා ''කම'' නොලියන ලෙස ඔබට අවවාද කරමි. වියෙන් හාල් මිස දහය්යා ගත යුතු නෑනේ ෧

විකසිත

